# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2010 අංක 18 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 2010 දෙසැම්බර් මස 07 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2010 දෙසැම්බර් මස 10 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : රු. 2.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

# 2010 අංක 18 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 2010 දෙසැම්බර් මස 07 වැනි දින]

එල්. ඩී.—ඕ. 12/2010

**1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉවත් කිරීම සඳහා ද, 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉවත් කිරීමට ආනුෂංගිකව විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 2010 අංක 18 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා (ඉවත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට ඉවත් කරනු ලැබේ. — 1996 අංක 1 දරන පනත ඉවත් කිරීම.

3. මේ පනතේ 2 වන වගන්තිය මගින් විධිවිධාන සලසා ඇති පරිදි 1996 අංක 1 දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනත ඉවත් කිරීමේ දී— — අන්තර්කාලීන විධිවිධාන.

(අ) ඉවත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලු නිලධරයන් සහ සේවකයන්ගෙන් යම් නිලධරයකු හෝ සේවකයකුගේ සේවය රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට අත්‍යවශ්‍ය බැව් භාණ්ඩාගාරයේ ලේකම් විසින් සලකනු ලබන්නේ නම් ඔවුන් ඉවත් කිරීමේ දිනයේ සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නිලධරයන් හෝ සේවකයන් ලෙස බඳවා ගනු ලැබිය යුතු අතර, ඉවත් කිරීමේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි එම නිලධරයන් සහ සේවකයන් ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ භුක්තිවිඳින ලද නියම සහ කොන්දේසිවලට වඩා අවාසිදායක නොවන කොන්දේසි මත ධුර දැරිය යුතු ය:

එසේ වුව ද, එකඟ වූ නියම සහ කොන්දේසි එම නිලධරයන්ට සහ සේවා නියුක්තිකයන්ට පෞද්ගලික විය යුතු ය;

(ආ) ඉවත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවතියා වූ හෝ බලාත්මක වූ ද කොමිෂන් සභාව පාර්ශ්වකරුවකු වූ ද කොමිෂන් සභාවේ වාසියට ඇත්තා වූ ද ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලු කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇප සහතික, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජනය පිළිබඳ ප්‍රදාන සහ ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය කොමිෂන් සභාවේ කවර හෝ ස්වභාවයක වෙනත් සාධන පත්‍ර, ඉවත් කිරීමේ දිනයේ සිට අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා රජය විසින් ඇතුළත් වූ හෝ තම වාසියට ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්, ඔප්පු, බැඳුම්කර, ගිවිසුම්, ඇප සහතික, ඇටෝර්නි බලපත්‍ර, නෛතික නියෝජනය පිළිබඳ ප්‍රදාන සහ කවර හෝ ස්වභාවයක වෙනත් සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබ ඉවත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින සියලු නඩු සහ නීති කෘත්‍ය ඉවත් කිරීමේ දිනයේ සිට ශ්‍රී ලංකා රජය විසින් හෝ ඊට එරෙහිව පවරන ලද නඩු සහ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒවා දිගට ම පවත්වාගෙන යා යුතු ය;

(ඈ) යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී යම් අධිකරණයක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ වාසියට හෝ ඊට එරෙහිව වාර්තාගත කරන ලද නඩු තීන්දු, තීන්දු ප්‍රකාශ හෝ ආඥා, ඉවත් කිරීමේ දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රජයේ වාසියට හෝ ඊට එරෙහිව වාර්තාගත කරන ලද නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ වෙනත් ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

වත්කම් හා බැරකම් සතුකර ගැනීම.

**4.** මේ පනත ඉවත් කිරීමේ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සියලු වත්කම් සහ බැරකම් මේ පනත ඉවත් කිරීමේ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා රජය වෙත සතු විය යුතු ය.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**6.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ —

අර්ථ නිරූපනය.

"ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව" යන්නෙන් 1996 අංක 1 දරන රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තිය මගින් පිහිටුවන ලද කොමිෂන් සභාව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.